අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල් කාර්යාලය
அத்தியாவசிய சேவைகள் ஆணையாளர் நாயகம் அலுவலகம்
OFFICE OF THE COMMISSIONER GENERAL OF ESSENTIAL SERVICES

**2025-දෙසැම්බර්-01 : 09.30PM**
**File Number : 2025/02**

# මාධ්‍ය නිවේදනය

දැනට පවතින අපදා තත්ත්වය ප්‍රයෝජනයට ගනිමින්, ඇතැම් වෙළඳුන් මහජනතාව මුහුණ දෙන අපහසුතා අයුක්තික ලෙස ප්‍රයෝජනයට ගැනීම සඳහා පාරිභෝගික භාණ්ඩ ඉතා ඉහළ මිලකට විකිණීමට උත්සාහ කරන බව නිරීක්ෂණය වී ඇත. මෙවැනි ක්‍රියාමාර්ග අත්‍යවශ්‍ය සේවා හා පාරිභෝගික ආරක්ෂණය සම්බන්ධ නීති හා නියමයන් යටතේ නීතිවිරෝධී වේ.

ශ්‍රී ලාංකීය ප්‍රජාව ලෙස එකමුතුවෙන් ආදර්ශවත් ලෙස ක්‍රියා කළ යුතු මෙම අවස්ථාවේදී, පාරිභෝගික භාණ්ඩ අයුතු ලෙස ඉහළ මිලකට විකිණීමෙන් අයහපත් ලාභයක් ලබා ගැනීමට උත්සාහ කිරීම සදාචාර විරෝධී මෙන්ම නීති විරෝධී ක්‍රියාවකි.

එමනිසා, වත්මන් අපදා තත්ත්වය ප්‍රයෝජනයට ගනිමින් මිල ඉහළ දැමීම, අනවශ්‍ය ලෙස පාරිභෝගික භාණ්ඩ ගබඩා කර සඟවා තබාගැනීම මගින් අයුතු හෝ කුඨ වෙළඳ උපක්‍රම අනුගමනය කරන ඕනෑම ව්‍යාපාරයකට හෝ පුද්ගලයකුට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගන්නා බව දැනුම් දෙමි.

සියලුම වෙළඳුන් උපරිම සිල්ලර මිල සටහන් භාණ්ඩ එම මිලට ද , අනෙකුත් භාණ්ඩ සාධාරණ මිලකට අලෙවි කරමින්, සෑම පුරවැසියෙකුටම පාරිභෝගික භාණ්ඩ අඛණ්ඩව ලබාදීම තහවුරු කල යුතුවේ.

බී.කේ.ප්‍රභාත් චන්ද්‍රකීර්ති
අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල්

**Email Address: cg@esgovsl.com ; cg@ocges.gov.lk**
අංක 150, ආර්.ඒ. ද මෙල් මාවත, කොළඹ 03, ශ්‍රී ලංකාව
எண். 150, ஆர்.ஏ. டி மல் மாவத்தை, கொழும்பு 03, இலங்கை
No. 150, R.A. De Mal Mawatha, Colombo 03, Sri Lanka